තරංග ජයසේන

# බළල් ඇස්



දවස - අද
වෙලාව - පාන්දර එකයි

නිහඬ බව මෙතරම් දරුණු වෙතැයි මම කිසි කලෙකත් නොසිතුවෙමි. කාමරයේ කපරාරු නොගෑ නිරුවත් බිත්තිවල ඇති සෑම ක්ෂුද්‍ර සිදුරකටම කණක් සවි කොට ඇතැයි මට සිතුණි. ඉටිපන්දමේ ඕලාරික එළිය මැදින් වුව මීනාගේ බළල් ඇස් දිදුලන හැටි පුදුමය.

අත බැඳි ඔරලෝසුවේ රේඩියම් කටු දෙක බලෙන් දෑසට පැන පැන වෙලාව නොකියන්නට මා සිටියේ කාලය ගැන කිසියම් නිශ්චිත හැඟීමකින් තොරවය. මීනාගේ මෝලක් මෙන් ගැහෙමින් තිබූ පපුව කෙමෙන් සාමාන්‍ය රිද්මයට හැරෙමින් තිබිණ.

"බඩගිනිද?"
මම පහත් හඬින් ඇසීමි.

ඇය ඔලුව වැනුවේ බඩගිනි නැති බව කියන්නටද, ඇසූ දේ නොතේරුණු බව කියන්නටදැයි දන්නේ උඩ ඉන්නා දෙවියන් පමණි.

මේ වන විට දන්නා සියළු සිංහල ද ඉංග්‍රීසි ද හමාර වී තිබූ බැවිනුත් මා දන්නා දෙමළක් නැති බැවිනුත්, අත් වලින් සහ දෙනෙත් වලින් කතා කළ හැකි අමුතුම භාෂාවක් අප විසින්ම නිපදවා ගෙන සිටියෙමු. ඉන් පසු ඈ අඟවා සිටියේ ඇඳ ගෙන සිටි ඇඳුම මාරු කර ගත යුතු බවයි. මම ඇයට මගේ නාන කාමරය පෙන්නුවෙමි. ඇය බෑගය ඇර රෑට අඳින ගවුමක් ද තුවායක් ද ගත් පසු මම ඇයට නාන කාමරයේ දොර ඇර දුන්නෙමි.

මීනා සුන්දර එකියෙකි. සිත තුල කැකෑරෙන දහසක් අපුල සිතුම් යටපත් කරගෙන, මහ රෑ කුටියක ගැහැණියක් සමග තනි වූ වෙනත් ඕනෑම මිනිසෙකුට ඇති වන සිතුවිලි මතුල ද සෙමෙන් මෝරමින් තිබිණ.

මීනා නාන හඬ ඇසේ. මම සිගරට්ටුවක් දල්වා ගතිමි.

සියළු සිතුවිලි මීනා නාන කාමරය තුළ හිඳින අයුරු රැගත් නිරුවත් රූපයකට ඡේදනය විණි. දල්වා ගත් සිගරට්ටුව දිගේ නුරාව පෙරෙමින් එතැයි මට සිතින.
මීටා පැය පහකට පෙර ඈ හමු වූ ඒ අනපේක්ෂිත නිමේෂය...!
දුම් වළල්ලක් නැගී ගුවන් ගත විය.

( ★★★★ )

දවස - ඊයේ
වෙලාව - රෑ 8.00 ට විතර
තැන - වවුනියාව සිට කොළඹ දුවන යාල්දේවී දුම්රිය ඃ ආපන ශාලා මැදිරිය.

සිල්පර කොට වල මර ළතෝනිය ගනනකටවත් නොගෙන යාල්දේවී රාගම දුම්රිය පොළ පහු කළා. මම සිටියේ ආපන ශාලා මැදිරියේ පුටුවක් උඩ. දීර්ඝ ගමනක් නිමා වෙන්න යද්දි දැනෙන සතුට සිගරට්ටුවක් හරහා පපුවට උරා ගනිමින් මම හිටියෙ. සී. ජී. ආර්. බල්බ් වල මළානික එලිය මැද්දෙ මම දුටු දෙය!

ඔව්! මීනාගෙ බළල් ඇස් දෙක.....

ඒ ඇස් දෙක කෝච්චියේ ප්‍රවේගයට ප්‍රතිවිරුද්ධ ව වේගයෙන් ඇවිත් මගෙ ඇස් දෙකේ හැපුනා. ඉහළට ගත්තු දුම් ගුලිය සෑහෙන වෙලාවක් පෙණහළු ඇතුලේ තියෙන්න ඇති.

ඈ හිනා වුනා... මම මත් වුනා....

එයාව දැකපු වෙලාවෙම මගෙ ඔලුවට කොහේදෝ ඉඳලා "මීනා" කියන නම ඇවිත් පදිංචි වුනා. ඒක ඔය මොකක් හරි සිල්ලර නවකතාවක තිබුණු දෙමළ කෙල්ලෙක්ගෙ නමක්.

අපි ඇස් වලින් කතා කරා...

කෝච්චිය පිරෙන්න හිටපු සිංහල මිනිස්සුත් දෙමළ මිනිස්සුත් නොදැකපු යමක් අපි දෙන්න අතර සිදු වෙමින් පැවතුනා.
කැළණි පාලමේ සිග්නල් එක ලං වෙත්දි කෝච්චිය දඩාං ගාලා නැවැත්තුවා. මගෙ මේසේ උඩ තිබුණු දුම් දාන කෝපි කෝප්පෙ ඉගිල්ලිලා ගිහිං බිම බුදියගත්තා. ටික වෙලාවකින් යටි ගිරියෙන් ලතෝනි තියන සද්දයක් ඇහුණා.

ඊගාවට.....

( ★★★★ )

දවස - ආයෙමත් අද
තැන - මගෙ බිත්ති හතර මැද

මගේ මනෝ ලෝකය දෙපළු කරමින් කඩු පහරක් පහත් විණ. ඇඳ උඩ තිබුණු මීනාගේ හෑන්ඩ් බෑග් එක නිකමට ඇර බැලූ විට දුටු දෙය....!

"පිස්තෝලයක්.....!"

ඇඟ දිගේ සනීපෙට නිදා හුන් හැම රෝමයක්ම නැගිට කෙළින් වී ඒ දෙස බැලුවෝය. ඇස්බැස්ටස් වහළය ඔලුව මත පාත් ව එන සෙයක් හැඟිණ.

දෙයියනේ... මම මේ මොකද්ද කර ගත්තේ? අහක යන හැපින්නක් අරං ඇවිත් කාමරෙ අස්සේ දා ගත්තා නේද? මීනා කවරෙක්දැයි සිතන්නට පවා මම බිය වීමි.

ටකස් යන අනුකරණයෙන් නාන කාමරේ ඇතුළු දොර අගුල කෑ ගැහුවේ මීනා එළියට එන බව කියන්නටය. එසැණින්, පිස්තෝලය නැවත හෑන්ඩ් බෑග් එක තුලට රිංගුවේය. දුහුල් ගවුමකින් සැරසී ආ මීනා තෙත තුවාය පුටු ඇන්දක නිදි කෙරවූවාය.

දෙයියනේ - මේකි මොකෙද්ද?

යටි පතුල් දිගේ නැගුණු හිරි වැටීමක් තත්පරයට අධියක වේගයෙන් ඉහළ නගිමින් තිබිණ. සිත තුල නැගෙන්නට වූයේ බියක්ද සතුටක්දැයි වෙන් කොට ගත නොහැකිව මොළයේ නියුරෝන අසරණ වන්නට ඇත.

මෙන්න...ඈ මං ළඟින් - ඇඳ උඩින් ඉඳ ගත්තා......

ඉටිපන්දම් එළිය දුහුල් ඇඳුමේ සියුම් තැන් වලින් රිංග රිංගා ඇගේ සෙළුකය විඳින්නට වන. අප දෙදෙනාගේ හුස්ම වැටෙන හඬත්, රේඩියම් ඔරලෝසුවේ කිටි කිටියත් හැර මුළු ලෝකයම ඒ මොහොත තුළ නිහඬතාවයක ගිලී ගියේය.

මටද නොදැනුවත්ව මගේ අතැඟිලි ඇගේ අතැඟිලි සොයා ඇඳ දිගේ ඇදී ගියේය. ඒ සොඳුරු ස්පර්ශය ලද මොහොතේ අප දෙදෙනාගේම සියොළඟ අග්නියකින් වෙළී ගියේය.

සිදු විය හැකිව තිබූ සියළු දේ ඒ මොහොතේ දී ඒ සයනය මත සිදුවින. සිරුරේ සෑම සෛලයක් පාසම ආදරය සහ රාගය ඇතිල්ලී ගියේය. මරණයේ නාමයෙන්, බෙදා වෙන් කළ හැකි කිසිවක් ඒ සයනය මත නොවින.

ඇස්බැස්ටස් වහලයේ සිදුරකින් රිංගා ගත් කණාමැදිරියෙක් ඉටිපන්දමට අභියෝග කරමින් සයනය මතින් පියාඹා ගියේය. පිළිවෙලකට තැම්පත්ව තිබූ ඇඳ පොරෝනාව අප දෙදෙනාට සාප කරමින් ඉවසා සිටින්නට ඇත.

සියල්ල නිමා විය.

සිහිනයෙන් මිදෙනු නොරිසි වූ මීනා තවමත් ඇඳ මතම සිටියෙදී මම දැල් වූ දුම් වැටියක නොදැල්වූ කොණේ සිටියෙමි. සිත, අධි-තෘප්තිකර මායරූපී ස්වභාවයක සිට ගුප්ත වූ ද බියජනක වූ ද ස්වභාවයකට රූපාන්තරණය වීමට ගත වූයේ එක සිගරට්ටුවක දහන කාලයකි. නිවෙන්නට ගොරෙද්දෙ අදින ඉටිපන්දම, මීනාගේ උස් පහත් වන ළය මඩලට දුබල ආලෝක දහරක් එල්ල කළේය.

කළ යුත්තේ කුමක්ද? හිස ගිනි ගෙන ඇති සෙයක් දැනේ.

ඒ පාර නං මීනාට නින්ද ගිහිල්ලා වගේ...!

අද මේ මොහොත අතීතයේ වැල්ල විසින් වසා ගනු ඇත. හෙට දිනය මා එන තුරු ඇඟිලි තුඩු මත නැගී බලා හිඳී. මෙවන් විටෙකදී වෙනත් ඕනෑම කෙනෙකු විසින් කරතැයි සිතිය හැකි දෙයම මා ද කළ යුතුය. ඔව්! ගත වෙන හැම තත්පරයක් ම, දැනටමත් බෙල්ලට වැටී ඇති තොණ්ඩුවේ වරපට තද කරනවා.

තේරුම් ගනින්... තේරුම් ගනින්...

මීනාට ඇහැරවා මම එළියට ගොස් කෑම ගෙන එන බව ඇඟවූයෙමි. ඇය මගේ බාහුවකින් අල්ලා ඇඳ මත ඉන්දවූවාය. එවිට ම වාගේ ඉටිපන්දම අවසන් ගමන් ගිය නිසා, නැගිට ලයිටරය දල්වා වෙනත් ඉටිපන්දමක් පත්තු කළෙමි.

ඇගේ දෑසක මෝදු වූ කඳුලක්, මෙට්ටයට පැන කොහු අතරේ ගිලී නොපෙනී ගියේය.

( ★★★★ )

තැන : පොලිස් පැමිණිලි අංශය
වෙලාව : අද පාන්දර 3.35

"මම යාල්දේවී එකෙන් ගෙදර ආවේ... ඊයේ වවුනියාවෙ තිබ්බ සාම කඳවුරේ වැඩ වලට ගියේ.

සීන් එක වෙන වෙලාවේ මම හිටියේ ආපන ශාලා මැදිරියේ.

මේ කෙල්ලත් එතන ඉස්සරහා මේසෙක ඉඳගෙන හිටියා. මම කම්මැලිකම යන්නත එක්ක ඒකි එක්ක කතා කරන්න හැදුවත් ඒකිට මෙලෝ දෙයක් තේරුනේ නෑ.

ට්‍රේන් එක එක පාරටම කැළණියේ සිග්නල් එක ළඟ නැවැත්තුවා. ඊට පස්සෙ ගෑණු මිනිස්සු මර ළතෝනි දීගෙන අපි උන්නු පෙට්ටිය දිහාවට දුවගෙන ආවා....

ඒ කතා වලින් මට තේරුණේ මැරයො වගයක් ට්‍රේන් එකට නැගලා ඒකෙ යන දෙමල්ලුංව මරනවා වගේ දෙයක්. උන් ළඟ ළඟම අපේ පෙට්ටිය දිහාවටත් එයි කියලා මට හිතුනු හින්දා, මම අර කෙල්ලගෙ අතින් ඇදගෙන මිනිස්සු එක්කම කෝච්චිය දිගේ ඉස්සරහට දිවුවා. ඊට පස්සේ මම ඒකිවත් අරගෙන ටොයිලට් එකක හැංගිලා දොරට ලොක් එක දා ගත්තා. අපි ඒ විදිහට විනාඩි විස්සක් විතර ඉන්න ඇති. සිංහලෙන් තිත්ත කුණුහරුප කියලා බණින එකයි දෙමලෙන් කෑ ගගහා අඩන එකයි ඇර වෙන්නෙ මොනවද කියලා අපි දක්කේ නෑ.

ටික වෙලාවකිං සිංහල කතා කරන සද්දේ නැති වුනා. කෙඳිරි ගාන ළතෝනි දෙන සද්ද විතරක් ඉතුරු වුනා. මම මීනාව ඇතුලෙ තියලා හිමින්ම ඔලුව එලියට දාල බැලුවා. තැන් තැන් වල මිනිස්සු කපලා මරලා දාල හිටියා. සමහරු හිටියේ පණ ඇද ඇද.

ඊට පස්සේ මම මීනාවත් අරගෙන රේල් පාරට බැස්සා. හොයලා හොයලා ගෙවල් පේලියක් මැද්දෙන් වැටිලා තිබුණු ලේන් එකකින් අපි නුවර පාරට මතු වුනා.

ඊට පස්සේ ටැක්සියක් අරගෙන ටෙම්පල් රෝඩ් එකේ මගෙ ඇනෙක්ස් එකට ඒකිවත් අරං ආවා. පස්සෙ මම ඒකිට පාන් ගෙනත් කන්න දුන්නා. ඒකි වචනයක්වත් කතා කලේ නෑ. ඒකි ටොයිලට් ගිය අතරෙ මම බෑග් එක බැලුවා. ඒකෙ පිස්තෝලයක් තිබුනා. මම ඒක දැකපු ගමන් ම තමයි රාළහමි, පොලිස්සියට ආවේ.... ඒකි තාම කාමරේ....!”

රාළහාමිගේ නිදිමත ඇස් වල තරු එළියක් දිලිසෙන්නට විය.

මින් මතු සිදු වූ දෙය ලිවීම නිරර්ථක බව නොකිවමනාය. නමුත් එක් දෙයක් පමණක් ලියා තබමි.

(★★★★)

පොලිස්සිය ඇවිත් කාමරේ හිටපු මීනාට හැන්ඩ් කප්ස් දැම්මා.

අන්තිම ම අන්තිම වතාවට ඒ බළල් ඇස් මාත් එක්ක කතා කළා. ඒ ඇස් වල කඳුළු තිබුණද කියලා හරියටම මතක නෑ.

ඈ මගෙ ඇස් දිහා බලලා මෙහෙම කිව්වා...!

”නාන් නීංගයික් කදලික්කිරේන්”**

මට ඒ වචන තෙරුනේ නෑ.

(මට ඒ වචන කිසිදාක තෙරුනේ නෑ.මට විතරක් නෙමෙයි ගොඩක් දෙනෙකුට ඒ වචන කවමදාකවත් තේරෙන්නෙ නෑ.)

** ( මං ඔයාට ආදරෙයි. )

---

**තරංග ජයසේන**
tharangajayasena@yahoo.com